# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1345/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 20/08/2024 පැය 1005

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2024.08.08 වන දින තංගල්ල පොලිස් වසමේ දී පොලිස් නිලධාරියෙකුට පොල්ලකින් පහරදී මනුෂ්‍ය ඝාතනය සිදු කිරීම හා තවත් පුද්ගලයකුට පහරදී තුවාල සිදු කිරීමේ අපරාධය සම්බන්ධයෙන් තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් විමර්ශන සිදුකර වෙළම්බඩ හා තංගල්ල පොලිස් වසම්වලදී සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් සන්තකයේ තිබී **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්, ඊ 56 පතරොම් 12 ක්, ජීව අත්බෝම්බයක් සහ හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 840 ක්** පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 33 වයස්වල පසු වන තංගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.

2024.08.19 වන දින දහවල් කාලයේදී කඩවත පොලිස් වසමේ ඉහල බියන්විල ප්‍රදේශයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.08.19 වන දින ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ෆර්ගියුෂන් මාවත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. දුම්රිය අනතුරක් - කොස්ගොඩ පොලිස් වසම.

2024.08.19 වන දින දහවල් කාලයේදී කොස්ගොඩ පොලිස් වසමේ මහ ඉඳුරුව දුම්රිය හරස් මාර්ගයේදී කුඩා ලොරි රථයක් බෙලිඅත්ත සිට මහව දක්වා ධාවනය වූ සීග්‍රගාමී දුම්රියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ලොරි රථයේ ගමන්කළ පුද්ගලයෙකු එම ස්ථානයේදීම මියගොස් ඇති අතර, තවත් පුද්ගලයෙකු තුවාල ලබා බලපිටිය රෝහල වෙත ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ විලේගොඩ, මතුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**